# MEDIA RELEASE

## එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම් සහ UNDP ආසියා පැසිෆික් ප්‍රධානියා එක් දින සංචාරය නිමා කරයි; ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරිය හමුවෙයි

*කන්නි විග්නරාජා මහත්මිය ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට UNDPහි අඛණ්ඩ සහයෝගය දක්වයි.*

**2024 ඔක්තෝබර් 15, කොළඹ, ශ්‍රී ලංකාව**: එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම් (ASG), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ආසියා සහ පැසිෆික් කලාපීය අධ්‍යක්ෂ, කන්නි විග්නරාජා මහත්මිය ඇගේ ශ්‍රී ලංකා එක්දින සංචාරය අතරතුර ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ අගමැති ආචාර්ය හරිනි අමරසූරිය මෙනෙවිය හමු වූවාය. සහකාර මහලේකම් විග්නරාජා මහත්මිය සමග UNDPහි ශ්‍රී ලංකාවේ නේවාසික නියෝජිත අසුසා කුබෝටා මෙනවිය ද මෙම හමුවීම්වලට සහභාගී වූවාය.

කන්නි විග්නරාජා මහත්මිය සිය හමුවීම්වලදී, ආර්ථික හා පාලන ප්‍රතිසංස්කරණ, වගවීම, නව්‍ය මූල්‍යකරණය, ඩිජිටල් පරිවර්තනය, රාජ්‍ය අංශය නවීකරණය, තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ජාතික ප්‍රමුඛතාවලට සහාය වීම සහ රටේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් UNDPහි දිගුකාලීන හවුල්කාරිත්වය වෙනුවෙන් කැපවීම අවධාරණය කළේය. ආර්ථිකයේ බහුවිධ කම්පන, ආපදා සහ දේශගුණික විපර්යාසවලට නිරාවරණය වන කාන්තාවන්, තරුණයින් සහ ග්‍රාමීය ගොවීන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මෙම ක්ෂේත්‍රවල UNDP ප්‍රතිපත්ති සහ තාක්ෂණික පිරිනැමීම් සහකාර මහලේකම්වරිය නැවත අවධාරණය කළේය.

කන්නි විග්නරාජා මහත්මිය දැනට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨතම ශ්‍රී ලාංකිකයා වන අතර පසුගියදා අවසන් වූ ජනාධිපතිවරණයෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණි පළමු එක්සත් ජාතීන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනිය ද වේ.

****නිමි****

**එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP):** *අර්බුදවලට ඔරොත්තු දිය හැකි ජාතීන් ගොඩනැගීම සහ සෑම කෙනෙකුගේම ජීවන තත්ත්වය වැඩිදියුණු කරන ආකාරයේ වර්ධනයක් මෙහෙයවීමට සහ පවත්වා ගැනීමට උපකාර කිරීම සඳහා සමාජයේ සෑම තරාතිරමකම පුද්ගලයන් සමඟ UNDP හවුල් වේ. රටවල් සහ භූමි ප්‍රදේශ 170 ක ක්‍රියාත්මක වන අපි ජීවිත සවිබල ගැන්වීමට සහ ඔරොත්තු දෙන ජාතීන් ගොඩනැගීමට උදව් කිරීම සඳහා ගෝලීය ඉදිරිදර්ශනය සහ දේශීය අවබෝධය ලබා දෙන්නෙමු.*

**සම්බන්ධතා:** socialmedia.lk@undp.org | 0779804188 | දිගුව 1501 **සමාජ මාධ්‍ය:** UNDP on Twitter | Facebook | Instagram
*www.lk.undp.org*